| මගේ අංකය<br>எனது இல<br>My No | DSD /HO/04/ER/09/ගෙවතු/2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2021.08.27 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත.

**සමෘද්ධි පවුල් සඳහා ක්‍රියාත්මක සෞභාග්‍යා ජාතික ගෙවතු වගා සංවර්ධන වැඩසටහන**

**2021/2022 - මහ කන්නය**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2021.08.03 සහ 2021.08.17 දිනැති ලිපි වලට අමතරවයි.

02. 2021/2022 මහ කන්නයේ ගෙවතු වගා සංවර්ධන වැඩසටහනේ ජාතික සමාරම්භක වැඩසටහන 2021.09.09 දින පවත්වන ලෙසට 'ගම සමඟ පිළිසඳරක්' ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකායේ සභාපති ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා සහ සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා ඇතුළු ගරු අමාත්‍යවරුන් සමඟ 2021.08.26 දින Zoom තාක්ෂණය ඔස්සේ පැවති රැස්වීමේදී උපදෙස් ලැබී ඇත. ඒ අනුව 2021.09.09 දිනට ගෙවතු වගා වැඩසටහන ආරම්භ කරන ලෙස කාරුණිකව දන්වමි.

03. මෙහිදී ඔබ දිස්ත්‍රික්කයේ එක් ග්‍රාම නිලධාරී වසමකින් උපරිමය සමෘද්ධිලාභීන් 75 දෙනෙකු පමණ මෙම ගෙවතු වගා සංවර්ධන වැඩසටහනට සම්බන්ධ කර ගැනීමෙන් දිවයින පුරා ගෙවතු දශ ලක්ෂයක් 2021/2022 මහ කන්නයේදී ආරම්භ කිරීමට හැකියාව ලැබෙනු ඇත.

04. උක්ත Zoom රැස්වීමට සහභාගී වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගන්නෝරුව බීජ සැකසුම් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් ගෙවතු සඳහා අවශ්‍ය වන බීජ පැකට් ලක්ෂ 8 ක් ලබාදීමට එකඟතාවය පළ කරන ලදී. ඒ අනුව එම මධ්‍යස්ථානයේ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් බීජ පැකට් ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වමි. මීට අමතරව අවශ්‍ය වන බීජ ප්‍රමාණය ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති බීජ අලෙවි මධ්‍යස්ථාන මඟින් මිලදී ගත හැක.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /**1ம் கட்டம்**, 4** வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல **/1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

05. ඒ අනුව ඇමුණුම 01හි සඳහන් ආකාරයට ඔබ දිස්ත්‍රික්කය සඳහා බීජ පැකට් මිලදී ගැනීමට ප්‍රතිපාදන වෙන් කර ඔබ වෙත ලබාදීමට කටයුතු කරන අතර එම ප්‍රතිපාදන යොදවා 2021.09.09 දින වන විට බීජ පැකට් මිලදී ගෙන ගෙවතුලාභීන් වෙත ලබාදීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

06. මෙහිදී ඔබට විශේෂයෙන් පෙන්වා දිය යුත්තේ ආර්ථික පුණර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය ලබා දී ඇති උපදෙස් පරිදි, සියළුම සමෘද්ධිලාභීන්ගේ ගෙවතු සංවර්ධනය කිරීම අප දෙපාර්තමේන්තුව සතු වගකීමක් වේ. එහෙත් අප දෙපාර්තමේන්තු වෙත වෙන්ව ඇති සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය මත ඇමුණුම පරිදි ප්‍රතිපාදන වෙන්කර දීමට කටයුතු කරනු ලැබූ බැවින් හැකිතාක් සමෘද්ධිලාභීන් මෙම වැඩසටහනට ඇතුලත් කර ගැනීමට ඔබ ඇතුළු සියළු නිලධාරීන් කටයුතු කළ යුතුවේ.

07. සංචරණ සීමා හේතුවෙන් ජනතාව නිවෙස් තුළම ගත කරන මෙම කාල පරිච්ඡේදයේදී ඔවුන් ගෙවතු වගාවට යොමු කරවීමට හැකි වීම ඉතා ඵලදායී වනු ඇත.

Covid – 19 වසංගත තත්ත්වය දක්වා වර්ධනය වීම පාලනයට සෞඛ්‍ය හා ආරක්ෂක අංශ ලබාදී ඇති උපදෙස් අනුව එම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු බව ද කාරුණිකව පෙන්වා දෙමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. ලේකම් , "ගම සමග පිළිසඳරක්" ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය -කාදැගැපි
2. ලේකම් , ජාතික සම්බන්ධීකරණ ජීවනෝපාය අනුකමිටුව, ආර්ථික පුණර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය -කාදැගැපි
3. ලේකම් , සමෘද්ධි, ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපර සංවිධාන රාජ්‍ය අමාත්‍යාංශය -කාදැගැපි
4. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී , ආර්ථික පුණර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය -කාදැගැපි
5. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව -කාදැගැපි
6. අධ්‍යක්ෂ, බීජ හා රෝපණ ද්‍රව්‍ය සැකසුම් මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නෝරුව -අ.ක.ස
7. ප්‍රධාන ගණකාධිකාරී , ගණකාධිකාරී දෙපාර්තමේන්තුව - ප්‍රතිපාදන නිදහස් කිරීමට හා අ.ක.ස
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක -අ.ක.ස
9. සියළුම අංශ ප්‍රධානීන් -අ.ක.ස